# විඥානවාදී අධ්‍යාපන සංකල්පය

දිල්ශාන් මනෝජ් රාජපක්ෂ

## 01. හැඳින්වීම

විඥානවාදය (idealism) තුළින් මනුෂ්‍යයාගේ මානසික සිතිවිලි හා විඥානයේ අගය වඩාත් පුළුල් ව අවධාරණය කෙරේ. විඥානවාදය සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන idealism යන්න එම භාෂාවෙහි idea යන්නෙන් තැනුනකි. එහි අදහස නම්, කල්පනාව, විඥානය, සංකල්ප යනාදිය යි. ග්‍රීක භාෂාවෙහි බැල්ම, බැලීම පිණිස (To see) යෙදෙන Idein යන්නෙන් idea යන පදය තැනෙන බව පෙනේ. විඥානවාදීන් අවධානය යොමු කරන්නට වූ ප්‍රධාන කරුණක් වන්නේ ලෝකය යනු මනසින් ගොඩනගන ලද කාල්පනික ලෝකයක් බවත්, එලෙස අප ලෝකය මනසින් ගොඩ නගා ඇත්තේ අපගේ අවශ්‍යතා හෙවත් උපයෝගිතා පදනම සැලකිල්ලට ගෙන බවත් ය. නූතන අධ්‍යාපනය සමඟ බැඳෙන ප්‍රධාන චින්තන ධාරා සතරකි. ඒවා නම්,

01. විඥානවාදය නොහොත් පරමාදර්ශීවාදය
02. යථාර්ථවාදය
03. උපයෝගීතාවාදය
04. සාංදෘෂ්ටිකවාදය

ඒ අනුව නූතන අධ්‍යාපන චින්තන ධාරා අතර විඥානවාදයට ලැබෙන්නේ සුවිශේෂ තැනකි (අබේපාල, ඒ., 2019ඃ පි. 26). දාර්ශනික අර්ථයෙන් විඥානවාදය සලකන විට විඥානය හා භෞතිකය යන ප්‍රධාන පදාර්ථ දෙකින් විඥානය ප්‍රාථමික යැයි සලකා ගෙන ගොඩ නැගෙන යම් මතවාදයක් වේ නම්, එය විඥානවාදය යි. විඥානවාදය දාර්ශනික චින්තනයක් ලෙස පෙරදිග මෙන් ම අපරදිග ද ඓතිහාසික විකාශනයක් වන අතර එහි ද ඉපැරණි ම මතවාදයන් භාරතීය වේද ග්‍රන්ථ ඇසුරෙන් දැකගත හැකි ය (සේනාධීර, එස්., 2006ඃ පි. 46). මෙම ශාස්ත්‍රීය ලිපියේ දී අධ්‍යයනය කරන්නේ විඥානවාදී අධ්‍යාපන

සංකල්පය යන්නෙන් අදහස ද විශේෂයෙන් ම අධ්‍යාපනය විෂයෙහි විඥානවාදය මගින් ඇති කරන ලද ධනාත්මක බලපෑම පිළිබඳව යි.

## 02. අධ්‍යාපන දර්ශනය

අධ්‍යාපනය යනු පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියක් වන අතර එය ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම, රසවිඳීම, පුහුණුව ආදී පුළුල් ක්ෂේත්‍ර රැසක් සම්බන්ධ වන බව පෙනේ. එක් අතකින් අධ්‍යාපනය වනාහි පුද්ගල සංවර්ධන ක්‍රියාවලියකි. අධ්‍යාපනය යන්නෙන් මතු කොට පිටතට ගැනීම, පිටතට මතු කරදීම, භාවිතය මාර්ගයෙන් වර්ධනය යන අර්ථ මතු වේ. ඒ අනුව අධ්‍යාපනය යන්නෙන් අදහස් වන්නේ පුද්ගලයාගේ පූර්ණ ශක්ති වර්ධනය යි.

අධ්‍යාපනය යනු මනුෂ්‍ය සංහතියේ හැම කෙනෙකුගේ ම අවශ්‍යතා සපයා ගැනීමට හා ඔහුගේ අභිවෘද්ධිය සලසා ගැනීමට මගපාදා දීම ද, ඔහුගේ අයිතිවාසිකම් හඳුනාගෙන එයින් ප්‍රයෝජනය ගැනීමට හා යුතුකම් අවබෝධ කර ගෙන එය ඉටු කිරීමට කරුණු සලසා දීම ද, එක් එක් මිනිසා තුළ සහජයෙන් පිහිටි දක්ෂතා වර්ධනය කරමින්, තමාට සහභාගී වන්නට අයිතිකමක් ඇති සමාජ සේවාවන්හි යෙදීමට හැකියාවක් ලබාදීමෙන් නීතියෙන් ඇති කරන ලද සමානාත්මතාව සාක්ෂාත් කිරීම ද සමාජයේ වැඩිදෙනාගේ සුබ විහරණය සලසා දීම ද වේ. විඥානවාදී අධ්‍යාපනයට ම පරමාදර්ශී අධ්‍යාපනය යැයි ද දක්වන මෙය අතර නූතන සියවසෙහි අධ්‍යාපන දර්ශනය උදෙසා මහඟු කාර්යයක් ඉටු කරමින් තිබේ.

## 03. විඥානවාදය

බටහිර දර්ශනයේ පැනෙන විඥානවාදය ග්‍රීක යුගය දක්වා දිව යන බව පෙනේ. ඇනෙක්සිගොරස්ට අනුව සියලු දෑ ගොඩනගා ඇත්තේ මනස යි. ලෝකය ඇත්තේ පුද්ගල මනස තුළ ය. මනුෂ්‍යයාගේ මනස ලෝකය හා දිව්‍යමය මාවත දරන්නේ ය. ප්ලේටෝනියානු දර්ශනයෙන් ද යම් යම් විඥානවාදී අදහස් ප්‍රකට වේ. ප්ලේටෝගේ දර්ශනයට අනුව විඥානයේ පැවැත්ම ස්වාධීන ය. මනස විඥානයෙන් තොරව නොපවතී. එය අවිනාශී ය. අභෞතික ය.

පරම සත්‍ය හෝ පරමාදර්ශ පිළිබඳ තාර්කික ව නිගමනය කිරීමේ වැදගත්කම අවධාරණයට කරන විඥානවාදය ප්‍රඥාව උදෙසා මානසික ව්‍යායාමවල යෙදීමේ වැදගත්කම පෙන්වා දෙයි. (චන්ද්‍රසේකර, එච්. එම්., 2009ඃ පි. 41) ඒ අනුව ලෝකය අවබෝධ කරගැනීමේ මාධ්‍ය මනස යි. ප්ලේටෝ පෙන්වා දෙන්නේ අධ්‍යාපනය යනු ළමා වියේ සිට ම රාජ්‍ය පාලකයන්ගේත් පුරවැසියන්ගේත් යුතුකම් හා වගකීම් පිළිබඳ හැඟීමක් ඇති යහපත් පුරවැසියන් බිහිකිරීම සඳහා පුද්ගලයා හැඩගැස්වීම යි. නිවැරදි දරුවෙකු තැනිය යුත්තේ මව් කුසෙහි පටන් බව ප්ලේටෝ පෙන්වා දී ඇත (චන්ද්‍රසේකර, එච්. එම්., 2009ඃ පි. 42).

ග්‍රීක චින්තයේ පැවති විඥානවාදී දර්ශනය කාලාන්තරයකින් නැවත මතු කර දක්වන්නේ ජෝර්ජ් බර්ක්ලේ ය. ඔහුට අනුව අදහස හෙවත් සංකල්ප පිළිබඳ සංජානනය වස්තූන්ගේ පැවැත්මට හේතුව යි. විෂය විඥානවාදය (Subjective idealism) නම් විඥානවාදයේ ප්‍රධාන ශාඛාව වෙත ඔහුගේ අවධානය යොමු වූ බව මේ අනුව පැහැදිලි වේ. එයට හේතුව නම් ඉහතින් දැක්වූ පරිදි බාහිර ද්‍රව්‍යයන්ගේ පැවැත්ම පෞද්ගලික මානසික ක්‍රියාකාරිත්වයක ප්‍රතිඵලයක් ලෙස දක්වමින් විඥානවාදී චින්තනය ඉදිරිපත් කිරීම යි. ඔහුට අනුව ලෝකයේ අප දකින වස්තූන් පිළිබඳ අදහසක් අපට නොමැති නම්, එය නිවැරදි ප්‍රත්‍යක්ෂයක් නොවේ. ඒ අනුව මානසික වශයෙන් ගොඩනඟා ගත් සංකල්ප අප දකින වස්තූන්ට සමාන වීම වැදගත් ය (to exist is to be conceived).

බර්ක්ලේ බිෂොප්වරයා බොහෝ සෙයින් සප්‍රමාණ තර්කය මත සිට විඥානවාදය තහවුරු කිරීමට උත්සාහ ගත්තේ ය. හෙතෙම අපගෙන් පරිබාහිර වූ පැවැත්මක් ඉන්ද්‍රිය දත්තවල තිබිය නොහැකි යැයි ද, ඒවා නොදකින, නොඅසන, නොඅල්වන හා රස නොබලන අවස්ථාවල දී ඒවායේ පැවැත්මක් (නැත යැයි ද) අවධාරණය කළේ ය. අර්ධ වශයෙන් හෝ මනස තුළ යමක් පිළිබඳ සංකල්පයක් ඇති නම්, එය ගෝචර වන අවස්ථාවේදී පවතී, යන්න බර්ක්ලේගේ මතය යි (රාජපක්ෂ, ආර්. එස්., 2009ඃ පි. 40). මේ අනුව බර්ක්ලේ නිගමනය කරන්නේ මනස හෙවත් විඥානය ඒ තුළ ඇති අදහස් ද හැර වෙන කිසිවක් ලෝකයේ නොපවතින බව යි. ඉන් පරිබාහිර ව කිසිවක් නොමැති බවත්, දැන ගන්නා හැම දෙයක් ම අනිවාර්ය අදහසක් බවත් බර්ක්ලේ පෙන්වා දී ඇත.

කාන්ට්ගේ දර්ශනයෙන් ඉදිරිපත් වන්නේ විෂයී විඥානවාදයකි. (Objective idealism) ඔහුට අනුව ලෝකය වනාහි සංකල්පීය (විඥානමය) ගොඩනැගීමකි. එය ඉන්ද්‍රීය සංජානනයෙන් වෙනස් වූවකි. ලෝකය යැයි අප හඳුනාගෙන තිබෙන්නේ මනසින් අප ගොඩ නගා ගත් සංකල්පයන් ය. ඒ අනුව යථාර්ථය අපට ග්‍රහණය කර නොහැකි ය. යමක යථාතත්ත්වය කිසිලෙසකින්වත් අපට දැනගත නොහැකි නමුත්, එහි අත්දැකීම හඳුනා ගත හැකි ය. ඥානයේ සාමාන්‍යය නම්, කල්පිතමය වූ පූර්ව සංශ්ලේෂණාත්මක පදනම යි. පූර්ව සංශ්ලේෂණාත්මක පදනමින් ලබා ගන්නා ඥානයට එපිටින් ඇති කිසිවක් දැනගත නොහැකි ය. කාන්ට් පෙන්වා දෙන ආකාරයට ආත්මය, ඊශ්වරයා බඳු සංකල්ප පිළිබඳ අප නිශ්ශබ්ද විය යුතු වන්නේ එබැවිනි.

ස්වාභාවිකත්වය හා සිද්ධාන්ත පිළිබඳ දක්වා අදහසේ දී බොසන්ක්වේට් (Bosanquet) පෙන්වා දෙන්නේ භෞතික ද්‍රව්‍යයක් නොවන මනස හෙවත් විඥානය සෙසු ඉන්ද්‍රීය අතරින් ප්‍රධාන වන බව යි. අත්දැකීම්වල ඒකීයත්වය වන්නේ විඥානය යි. උපරිම ආධ්‍යාත්මය වන්නේ යථාර්ථය යි. බාහිර ලොවෙහි ස්වතන්ත්‍ර වශයෙන් පවත්නා යථාර්ථයක් නොමැත. එම යථාර්ථය ගැබ් වී පවත්නේ විඥානයෙහි ය. ඒ අනුව බොසන්ක්වෙට් පෙන්වා දෙන විඥානවාදය ලොවෙහි යථාර්ථය පිළිබිඹු කරන්නකි. මේ තුළින් හෙතෙම ගොඩනගනුයේ ආධ්‍යාත්මික විඥානවාදය (Spiritual idealism) යි.

හේගල් (Hegal) සිය දාර්ශනික චින්තාවලියේදී නියත, අවිනාශී, සදාතනික දෙය ලෙස විඥානය යන්න සැලකූ බව පෙනේ. හේගල්ගේ මෙම වාදය නියත විඥානවාදය (Absolute idealism) ලෙස හැඳින්වේ. නූතන දාර්ශනික අවධිය තුළ ජෝර්ජ් හේගල් වැදගත් ලෙස ඇගයෙන්නේ පරිහානියට යමින් තිබූ විඥානවාදී දර්ශනය ඉන් මුදවා ගැනීමේ ප්‍රබල උත්සාහයක නිරත වීම නිසා ය. බුද්ධිවාදය හා අනුභූතිවාදය තුළින් ලෝකය විග්‍රහ කළ නොහැකි බවත්, ඊට සුදුසු ම විඥානවාදය බවත් හේගල්ගේ අදහස යි (විදානගමගේ, කේ., (1997)ඃ පි. 50.) බ්‍රැඩ්ලි (Bradley) ඉදිරිපත් කරන විඥානවාදයට අනුව බාහිර ලෝකයේදී පවත්නා සබඳතා අර්ථ ශූන්‍ය ය. අත්‍යන්ත වශයෙන් පුද්ගලයා හා පවත්නා විඥානමය දෑ පමණක් අර්ථවත් ය.

විඥානවාදී දර්ශනයේ යම්තාක් දුරකට පිළිගත හැකි සත්‍ය ගැබ් වී පවතින බව දාර්ශනිකයෝ පිළිගනිති. භ්‍රාන්තීන් දකින අවස්ථාවල දී අපට පැහැදිලි විඥානවාදයක් ඉදිරිපත් කළ හැකි ය. ''විඥානවාදී දර්ශනයේ තවත් පියවරක් ලෙස ප්‍රපඤ්චවාදය ඉදිරිපත් වී තිබේ. බාහිර ලෝකයේ වස්තූන් ගැන කථා කරන විට ඒවායේ පැවැත්මක් ගැන හෝ නොපැවැත්මක් ගැන කථා නොකළ යුතු බව එමගින් කියැවේ. එයට හේතුව නම් අපට පෙනෙන වස්තූන් මායාවක් යැයි නිතර ම සැක කළ හැකි නිසා එම වස්තූන් පිළිබඳව අප කියන සමහර දේවල් වැරදි විය හැකි බැවිනි. ඒ අනුව ''අතන තරුවක් තිබේ'' යනුවෙන් කිවහොත් සමහර විට එය වැරදි විය හැකි වන්නේ එම තරුව විනාශ වී අවුරුදු ගණනක් ගත වී තිබීමට ඉඩ ඇති බැවිනි. ප්‍රපංචවාදීන්ට අනුව වස්තූන් ගැන කථා කරන විට කතා කළ යුත්තේ අපට පෙනෙන දෙය හා ආකාරය පමණි. ඒ අනුව ඔවුන් සත්වාදය ද දැඩි ලෙස විවේචනය කර ඇත. ප්‍රපංචවාදය ද පසුකාලයේ විවේචනයට පාත්‍ර වූයේ දකින සියලු දේ සැක කරන්නේ නම්, එමගින් නිවැරදි ඥානයක් ලැබිය හැක්කේ කෙසේද? යන ගැටලුව හමුවේ දී ය. අප දකින සියලු දේ භ්‍රාන්තීන් ද? යනුවෙන් විමසන ප්‍රශ්නයන්ට පිළිතුරු සෙවීමට ප්‍රපංචවාදීන්ට උත්සාහ ගැනීමට සිදු වූයේ එබැවිනි.

අදහස යන වදනින් අයෙකුගේ මනසෙහි ඇති දෙයක් පිළිබඳ අරුත හැඟේ. ඒ අනුව ගසක් යනු සම්පූර්ණයෙන් ම අදහස්වලින් සැදුණු දෙයක් බව කී විට එසේ නම් ගස තිබිය යුත්තේ සම්පූර්ණයෙන් ම අපගේ සිත තුළ බව නිරායාසයෙන් ම හැඟේ. යමෙකු අප සිත තුළ සිටින බව කියන්නේ වුවත් ඉන් ඒ මිනිසා අපේ සිත තුළ ජීවත් වන බව නොව ඔහු පිළිබඳ සිතුවිලි අපේ සිත තුළ ඇති බව අදහස් වේ. යම් පුද්ගලයෙකු හෝ දෙයක් හෝ එකවර මතකයට පැමිණි කළ ඉන් අදහස් වන්නේ මතකයට නැගුණු දෙය ඊට පෙර ඔහුගේ සිත තුළ තිබුණු බවක් නොව එය පිළිබඳ අදහස් ඔහුගේ සිත තුළ තිබුණ බවත්, පසුව එම සිතිවිල්ල මතකයෙන් ගිලිහී ගොස් තිබුණු බවත් ය. බර්ක්ලේගේ විඥානවාදයෙන් ගම්‍ය වන ගැටලුකාරී අදහසක් වන්නේ ගසක් ගැන දැනගත හැකි නම්, එය අපේ සිත තුළ ඇතැයි කීම, අප යමෙකු ගැන සිතන්නේ නම් ඒ මිනිසා අපේ සිත තුළ ඇතැයි කීමට සමාන වීම යි. මෙහි ඇති ගැටලුව තවත් නිදසුනක් ඇසුරෙන් ඔප්පු කරන්නේ නම්, ගමනක් යෑමට පිටත් වන අතරේ ම ගෙදරට

ගිනි තබා ගියහොත් ආපසු පැමිණෙන විට කිසිවෙකු එම ගින්න පාලනය නොකළහොත් නිසැකව ම මුළු ගෙය ම අළු වී යනු ඇත. මෙහිදී ගින්නෙහි ක්‍රියාකාරිත්වයට මනසෙහි අදාළත්වයක් නොවූ බව පැහැදිලි ය.

අපගේ ඉන්ද්‍රිය සංජානනයෙන් ස්වතන්ත්‍ර ව බාහිර ලෝකයක් නැත, යනුවෙන් ඉදිරිපත් කරන විඥානවාදීන් "බාහිර ලෝකය වනාහි ඉන්ද්‍රියෝපලබ්ධීන්ගේ හා විඥප්තීන්ගේ හුදු සම්බන්ධයක් පමණක් ය" යන්න දක්වයි. ඒ අනුව බාහිර ලෝකය වනාහි පුද්ගලයාගේ හුදු නිර්මාණයක් පමණි. මෙම විඥානවාදී පදනම ආත්මීය හෙවත් මනෝ මූලික තත්ත්වයක් බව ප්‍රකට වේ.

විඥානවාදී ස්ථාවරයේ පවත්නා බරපතල ගැටලු විවේචනය කරමින් යම් ආකාරයක සත්වාදයක් (Realism) බටහිර දර්ශනයෙහි පැන නැගුණු බව පෙනේ. විසිවන සියවස ආරම්භක යුගය වන විට සත්වාදයක් බිහි කළ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ දාර්ශනික බ්‍රැඩ්ලිගේ "තර්කයේ මූලධර්ම" (Principles of Logic) නැමැති කෘතියෙන් අදහස්වලින් පෙනේ. "යම් කිසි සංකල්පයක අර්ථය සම්පූර්ණයෙන් ම මනසින් ස්වතන්ත්‍ර ව පවතී" (ඥානසිරි, පී. ජී. එස්., 1995ඃ පි. 49.) යන ඔහුගේ ප්‍රකාශය මෙයට නිදසුනකි. සමකාලීන දාර්ශනිකයින් දෙදෙනෙක් වන බර්ට්‍රන්ඩ් රසල් සහ ජී. ඊ. මුවර් යන දෙදෙනා බ්‍රැඩ්ලිගේ දාර්ශනික මාවතෙන් වෙනත් මාවතක් අනුව සත්වාදය ඉදිරිපත් කළ බව පෙනේ. රසල් ම ප්‍රකාශ කරන ආකාරයට විඥානවාදය කරා ප්‍රහාර එල්ල කිරීම මෙහෙය වූයේ මුවර් ය. රසල් කිසි පැකිලීමකින් තොර ව ඔහු අනුගමනය කළේ ය. සත්වායේ මූලික පිළිගැනීම වන්නේ අපගේ සංජානනයෙන් ස්වතන්ත්‍ර ව වස්තූන් පවතින බව යි.

සත්වාදයේ ආදිතම අවස්ථාව ග්‍රීක චින්තනය දක්වා විහිදී යන බව පෙනේ. අද්වෛත සත්වාදය (Monistic Realism) ඉදිරිපත් කළ තේල්ස්, ඇනෙක්සිමැනඩර්, අනෙක්සීමිනස්, හෙරාක්ලීටස් ආදීන්ට අනුව ජලය, වාතය, ගින්න ආදිය අවසාන සත්තාව යි. එබැවින් එම සත්වාදය භෞතිකවාදී ස්වරූපයක් ගනී. ද්වෛත සත්වාදයක් ඉදිරිපත් කළ ග්‍රීක දාර්ශනිකයන් වන ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ද නූතන බටහිර දර්ශනයේ ඩේකාර්ට් ද පෙන්වා දෙනුයේ

කාය-චිත්ත යන කරුණු දෙකෙහි පැවැත්ම යි. පරමාණුවාදය ඉදිරිපත් කළ දාර්ශනිකයන් අයත් වනුයේ බහුත්ව සත්වාදයට (Pluralistic Realism) ය. එබැවින් එය පරමාණු සත්වාදය (Atomic Realism) ලෙස ද හැඳින්වේ. ප්ලේටෝනියානු හා ඇරිස්ටෝටලියානු සත්වාදය දේවවාදයක් වෙත යොමු වන බැවින් එය ප්‍රතික්ෂේප කරන මුවර් හා රසල් විඥානයට ගොදුරු වූ ඉන්ද්‍රියාර්ථ පිළිබඳ කරුණු එහි පැවැත්ම සනාථ කිරීමට දායක නොවන බව අවධාරණය කළහ. පොදු මතයට ගරු කිරීම, ව්‍යවහාර භාෂාවට එකඟ වීම, විභජනය ක්‍රමයක් ලෙස භාවිත කිරීම යන ප්‍රධාන ප්‍රතිපත්ති තුන අනුව සත්වාදය ඉදිරිපත් කළ මුවර් භාෂා විශ්ලේෂණයේ ඇති වැදගත්කම අවධාරණය කළේ ය. විඥානවාදීන් පෞද්ගලික මතයට සීමා කොට ඒ මත යැපෙන්නට සැලැස්වූ බාහිර ලෝකයේ ස්වාධීන ස්වතන්ත්‍ර පැවැත්මක් ඇති දෙයක් ලෙස පත්වීමෙහි ලා සත්වාදීන්ගේ දාර්ශනික ක්‍රියාව ද ක්‍රමානුකූල ව දෝෂ දර්ශනයට පාත්‍ර වන ලද්දේ සමකාලීන දාර්ශනිකයින් විසින් ම ය.

### 04. විඥානවාදය පිළිබඳ බෞද්ධ ස්ථාවරය

විඥානය පිළිබඳ බෞද්ධ විවරණ අන්තර්ගත සූත්‍ර දේශනා කෙරේ අවධානය යොමු කරන විට විඥානය පිළිබඳ පැහැදිලි අදහසක් බුදුසමය තුළ අන්තර්ගත වන බව පෙනේ. නමුත් ආදි බෞද්ධ දර්ශනය කිසිදු ලෙසකින් හෝ විඥානවාදයක් ඉදිරිපත් නොකරන බව ද අවධාරණය කළ යුතු ය. මුල් බුදුසමයේ ඉන්ද්‍රිය ඥාන විභාගය පිළිබඳ විග්‍රහය පහදා දෙන මහා හත්ථිපදෝපම සූත්‍රයට අනුව ඉන්ද්‍රිය ඥානය සඳහා භෞතික අංශයේත්, මානසික අංශයේත් පැහැදිලි සබඳතාවක් අවශ්‍ය ය. එහිදී ඉන්ද්‍රිය අරමුණු හා මානසික යොමුව අතර සබඳතාව පැහැදිලි ව දක්වා තිබේ. එනම්,

I. ආධ්‍යාත්මික වූ චක්ෂු ඉන්ද්‍රිය විකල නොවේ. බාහිර රූප ධර්ම ඇස් හමුවට පැමිණ නැත. මානසික යොමුව ද නැත. එකල්හි 'රූපයකි' යන්න දැනීම (චක්ඛු විඤ්ඤාණය) ඇති නොවේ.

II. ආධ්‍යත්මික වූ චක්ෂු ඉන්ද්‍රිය විකල නොවේ. බාහිර රූප ඇස් හමුවට පැමිණ ඇත. එහෙත් මානසික යොමුව නැවත එකල්හි ඉන්ද්‍රිය ඥානය පහළ නොවේ.

III. අධ්‍යාත්මික චක්ෂු ඉන්ද්‍රිය විකල නොවේ. බාහිර රූපය ද ඇස හමුවට පැමිණෙයි. මෙනෙහි කිරීම ද යොමුව තිබේ නම් ඉන්ද්‍රිය ඥානය පහළ වේ (මනි; 1, මහා හත්ථිපදෝපම සූත්‍රයඃ පි. 460).

මුල් බුදුසමයට අනුව විඤ්ඤාණය සත් පදාර්ථයක් නොවේ. හේතු ප්‍රත්‍ය සමවායක ප්‍රතිඵලයකි. එක් අවස්ථාවකදී සාති භික්ෂුව විඥානය සත් පදාර්ථයක් ලෙස අනන්‍ය ව සසර සැරිසරන බව බුදුන් වහන්සේ විසින් ද පවසා ඇතැයි නිගමනය කළ දෘෂ්ටිගාමී අදහස බුදුරදුන් විසින් ම විවේචනය කරන ලදී (මනි, 1, මහා තණ්හාසංඛ්‍ය සූත්‍රය, පි. 606). තමන් වහන්සේ නොයෙක් අයුරින් විඥානය ප්‍රතීත්‍යසමුත්පන්න බවත්, ප්‍රත්‍ය ධර්ම සමායෝගයෙන් තොර ව විඥානය පහළ නොවන බවත් වදාරා ඇති බව අවධාරණය කළහ. බුදුසමයට අනුව විඥානය වනාහි හුදු ස්වාධීන පදාර්ථයක් නොවේ. යම් යම් ප්‍රත්‍යයන් නිසා පහළ වන විඥානය ඒ නයින් හැඳින්වේ. ඇසත් නිසා රුවත් නිසා ඇසෙහි විඤ්ඤාණය (චක්ඛු විඤ්ඤාණය) පහළ වේ. එලෙස ම සෙසු ඉන්ද්‍රියන්ට අදාළ ව මෙම විඤ්ඤාණය පහළ වේ (මනි, 1 මධුපිණ්ඩික සූත්‍රයඃ එම, පි. 280). විඤ්ඤාණයෙහි ආත්මවාදී පදනම දුරලීම සඳහා ඵේණපිණ්ඩූපම සූත්‍රයේදී එය මායාවකට (මායූපමංච විඤ්ඤාණං) (සංනි; 3, ඵේණපිණ්ඩූපම සූත්‍රයඃ පි. 244.) උපමා කර ඇත.

මුල් බුදුසමය විඤ්ඤාණවාදයකට නොවැටෙන නමුත් පශ්චාත් කාලීන ව බෞද්ධ සම්ප්‍රදායක් ලෙස හට ගැනෙන විඤ්ඤාණවාදය මූලික තේමාව කොට ගත් යෝගාචාර දර්ශනයෙන් බටහිර දර්ශනයේ ඉදිරිපත් වන පරිදි හුදු විඤ්ඤාණවාදයක් ඉදිරිපත් වන බව ඇතැමුන්ගේ මතය යි. මේ පිළිබඳ මතය ද එතරම් නිදොස් නොවන බව පැහැදිලි වන්නේ යෝගාචාර විඤ්ඤාණවාදය සම්බන්ධයෙන් එම සම්ප්‍රදායේ ම අදහස් දැරූ ආචාර්යවරයෙකු වන වසුබන්ධු හිමි රචනා කරන විඤ්ඤප්තිමාත්‍රතාසිද්ධි නම් කෘතියේ එන මෙම ප්‍රකාශයෙනි.

> "විඥප්තිමාත්‍ර මෙවෛත - දසදර්ථාවභාසනාත්
> යථා තෛමිරිකස්‍යාසාත් - කේෂචන්ද්‍රාදි දර්ශනම්"
> (විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය, 1964ඃ පි. 205.)

මෙහි අරුත නම් නැති වස්තුවක් ඇති ලෙස වැටහීම නිසා මෙය හැඟීම් මාත්‍රයක් පමණි. දෑසෙහි තිමිර පටලය සෑදුණු පුද්ගලයෙකුට (පෙනීමේ වරද නිසා) හිසකෙස්, සඳ මඩල, ආදී නැති වස්තුවක් (ඇති ලෙස) පෙනෙන්නාක් මෙනි යන්න යි. බටහිර උග්‍ර විඥ්ඥාණවාදීන් මෙන් බෞද්ධ යෝගාචාර සම්ප්‍රදාය බාහිර ලොවෙහි නාස්තිත්වයක් කිසිඳු විටෙක පිළිගත් බව නොපෙනේ.

## 05. විඥානවාදී අධ්‍යාපනය

විඥානවාදී අධ්‍යාපනය පෙර'පර දෙදිග දාර්ශනිකයන් ගොඩනැගූ අති දැවැන්ත චින්තර පරාසයක් වන අතර එහි දී විඥානවාදය ගොඩනැගූ ප්ලේටෝ, කාන්ට්, හේගල්, ෆොයිබෙෂ් විලියම් ටී. හැරිස්, ස්වාමි දයානන්ද හා රවීන්ද්‍රනාත් තාගෝර් යන දාර්ශනිකයන් ම පුරෝගාමී වී ඇත (කුමාරපේලි, ටී., 2022: පි. 46). ලෝකය අවබෝධ කරගැනීමේ ප්‍රධාන මාධ්‍යය මනස යි. මනස වැඩි දියුණු කරගැනීම සඳහා අධ්‍යාපනය අවශ්‍ය වේ. ඒ අනුව සත්‍යවාදී බව කුමක්දැයි වටහාගැනීම විඥානවාදය යි (සේනාධීර, එස්., 2006: පි. 46). ප්ලේටෝ දක්වන ආකාරයට ඥානය යනු බාහිර ලොව පිළිබඳ ව නොව අමරණීය සදාකාලික ලෝකය පිළිබඳ ව ලබාගන්නා දැනුම වන අතර මෙබදු අදහස් දක්වන නිසා ඔහු ද බටහිර විඥානවාදී චින්තන ගුරුකුලයට එකතු වන්නේ ය. ඇරිස්ටෝටල් ද විඥානවාදී අධ්‍යාපන චින්තනයෙහි පුරෝගාමියෙකි. විඥානවාදයට අනුව අධ්‍යාපනය යනු උසස් සදාචාරයක් ඇති කරලීම සඳහා පුද්ගල අභ්‍යන්තරය තුළින් ගැඹුරු යථාර්ථවාදී බවක් ඇතිකිරීම යි. එසේ ම පරම සත්‍ය දැනගැනීමට කල්පනාව වැදගත් බව දක්වන චින්තනය යි (අබේපාල, ඒ., 2019: පි. 26). විඥානවාදී අධ්‍යාපන චින්තනයට අනුව පුද්ගල ස්වභාවය කොටස් දෙකකට බෙදා දැක්වෙන අතර එනම්,

01. පුද්ගල මූලික ස්වභාවය
02. පුද්ගල ආධ්‍යාත්මික ස්වභාවය යනාදිය යි.

තවදුරටත් එම චින්තනයෙන් කියවෙන්නේ පුද්ගල මූලික ස්වභාවය ආධ්‍යාත්මික ස්වභාවයක් දක්වා උසස් කිරීම බව යි (සේනාධීර, එස්., 2006: පි. 51). මෙම අභිප්‍රාය ප්ලේටෝගේ අධ්‍යාපන

චින්තනයෙන් පිළිබිඹු වන අතර ප්ලේටෝගේ අධ්‍යාපන අරමුණු තුනෙන් ද මෙම කරුණ පැහැදිලි වෙයි. එනම්,

01. පුද්ගලයාගේ පෞද්ගලික දක්ෂතා හඳුනාගැනීම
02. දැනුම් ගවේෂණයට උදව් කිරීම
03. සමාජයට අවශ්‍ය ලෙස පුද්ගලයා සකස් කිරීම (සේනාධීර, එස්., 2006ඃ පි. 51).

මෙම අදහස ම තනි ව ගන්නේ නම්, අධ්‍යාපනයෙහි අරමුණ වන්නේ වඩා හොඳින් සමාජයෙහි සේවය කිරීම සඳහා සෑම පුදගලයෙකුගේ ම හැකියාවන් හා සදාචාරාත්මක විශිෂ්ටත්වය හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීම යි (අබේපාල, ඒ., 2019ඃ පි. 26). එහි ලා විෂයමාලාව විය යුත්තේ මනස පෝෂණය කරන සාහිත්‍ය, ඉතිහාසය, දර්ශනය හා සහ ආගම යි. එසේ ම ඊට යෝග්‍ය ඉගැන්වීමේ ක්‍රම වනුයේ දේශන, සාකච්ඡා හා සොක්‍රටීක සංවාද ක්‍රමය යි. චරිත සංවර්ධනය කිරීමට යෝජනා කරන්නේ ආදර්ශ පුද්ගලයන් හා වීරයන් අනුකරණය කිරීම ඔස්සේ ය (අබේපාල, ඒ., 2019ඃ පි. 27).

**06. විඥානවාදී අධ්‍යාපන චින්තනයෙහි උපයෝගීතාමය අගය**

විඥානවාදී අධ්‍යාපන චින්තනයට අදාළ තේමාව වන්නේ යථාර්ථය කිසිවිටෙක වෙනස් නොවේ. එය අධ්‍යාත්මික වූ සත්‍යය යි. එහි යථාර්ථමය දැක්ම නම් ''සත්‍ය වෙනස් නොවන අකාලික හා විශ්වීය ස්වභාවයකින් යුතු ය'' යන්න යි. එමෙන් ම ''එය ආධ්‍යාත්මික ය'' යන්න යි.

එසේ ම දැනුම පිළිබඳ ව ද විඥානවාදී අධ්‍යාපන චින්තනයට ස්ථාවරයක් ඇත. දැනුමෙහි මූලාශ්‍රය දෙවියන් බවත් පෙන්වා දෙන මෙම චින්තනය දක්වන්නේ දැනුම නම් දිව්‍යමය යථා ඥානය හා පරම සත්‍ය පිළිබඳ ප්‍රඥාව යි. එය බාහිර ලොව පිළිබඳ ව නොව අමරණීය සදාකාලික ලෝකය පිළිබඳ ව ලබාගන්නා දැනුමකි. මෙම ඥානය ලබා ගන්නා ප්‍රධාන මාර්ග දෙකකි.

01. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වෙනුවට අනුමානය හා විශ්වාසය මත දැනුම ලැබීම

02. ගණිතය හා තර්කනය ඇසුරෙන් අතීන්ද්‍රිය ඥානය ලබා යථාර්ථය පසක් කරගැනීම

යම් කරුණක් පිළිබඳ දිගින් දිගට ම කරනු ලබන තර්කනය හා සංවාද නිසා ඇති වන ප්‍රතිවේදය මගින් ප්‍රඥාව හා පරම සත්‍ය පහළ වේ (අබේපාල, ඒ., 2019: පි. 28).

විඥානවාදී අධ්‍යාපන චින්තනය අවධාරණය කරන ප්‍රධාන සාරධර්ම පද්ධතිය කරණු වශයෙන් පහත පරිදි ය.

1. යුක්ති ගරුක වීම, නීතිගරුක වීම, පරාර්ථකාමී වීම හා ආත්ම දමනයෙන් යුතු පුරවැසියෙකු වීම
2. උසස් චරිත සංවර්ධනයක් ඇති කිරීම
3. සදාචාර ගුණධර්ම ප්‍රගුණ කිරීම
4. යුක්තිය, සමාජ සාධාරණත්වය
5. දූෂිත තත්ත්වයන් නැති කිරීම
6. යුතුකම් හා වගකීම් නිවැරදි ව ඉටු කිරීම
7. ප්‍රජාතන්ත්‍රවාදය හා සංස්කෘතිය ආරක්ෂා කිරීම
8. මෘදු ගුණයෙන් යුතුවීම
9. යහපත් ආකල්පවලින් යුතු වීම
10. යහපත් පුරුදුවලින් යුතුවීම (අබේපාල, 2019: පි 27).

එසේ ම විඥානවාදී අධ්‍යාපනඥයන් ගෙනහැර දක්වන ආකාරයට ඉගෙනුම් එල කිහිපයකි. ඒවා නම්,

1. ප්‍රශ්නකරණය, සංවාද ක්‍රමය සත්‍ය සෙවීම සඳහා භාවිත කළ යුතු ය.
2. ක්‍රීඩා ක්‍රමය, අනුකරණය, සංගීතය, කතාන්දර කීම, රඟපෑම වැනි ශිල්ප ක්‍රම භාවිත කිරීම
3. ගැහැණු පිරිමි දෙපක්ෂයට ම පොදු වූ වයසට හා ලැදියාවන්ට අනුරූප විෂයමාලාවක් භාවිත කිරීම

4. ජිම්නාස්ටික්, ශාරීරික අභ්‍යාස, සංගීතය, සාහිත්‍ය, චිත්‍ර, නාට්‍ය, ගණිතය, ජ්‍යාමිතිය, තාරකා විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, භාෂාව ආදී විෂයයන් ඉගැන්වීම
5. කායික හා මානසික සංවර්ධනය ඇති කිරීම
6. පෞද්ගලික දක්ෂතා හඳුනාගෙන දැනුම ගවේෂණයට උපකාරී වී සමාජයට අවශ්‍ය පුද්ගලයකු සකස් කිරීම
7. ප්‍රඥාව, නිර්භීතකම හා උපේක්ෂාව ගොඩනැගීමට අවශ්‍ය ඉගෙනුම ලබාදීම
8. ඉගැන්වීම් තුළින් ශිෂ්‍යයා ශික්ෂණය කළ යුතුය (අබේපාල, ඒ., 2019ඃ පි. 27).

විඥානවාදී අධ්‍යාපන චින්තනය අවධාරණය කරන විෂයමාලා අගය කරන්නේ ස්වභාව විද්‍යාවට වඩා මානව විද්‍යාව යි. ඒ අනුව අවධාරණ කරන විෂයමාලාවන්හි අන්තර්ගතය ක්ෂේත්‍ර කිහිපයකට යොමු වෙයි. ඒවා නම්,

1. විශ්වයීය අංශ හෙවත් තමා අවට ලෝකය පිළිබඳ දැනුම
2. ශිෂ්ටාචාර ක්ෂේත්‍රය
3. දර්ශනය හා කලාව ඇතුළත් සංස්කෘතික අංශය
4. චිත්තවේග ඇතුළත් පෞරුෂ අංශය යනාදිය යි (කුමාරපේලි, ටී., 2022ඃ පි. 240).

විඥානවාදීන්ට අනුව සමාජයෙහි වැදගත් ම අංශය පාසල යි. සදාචාරය වර්ධනය සිදු කරන ප්‍රධාන ආයතනය බැවිනි. ආත්ම සාක්ෂාත්කරණය හා අධ්‍යාත්මික පරිපූර්ණත්වය ඉලක්ක කරගත් විඥානවාදී අධ්‍යාපන චින්තනය සමාජ උත්තරණය සදාචාරාත්මක නිර්ණායක මත වඩාත් යෝග්‍ය ලෝකයක් අපේක්ෂා කරයි.

**7. සමාලෝචනය**

මානව පැවැත්මේ උතුම්ම අභිලාෂයන් වන සදාචාරාත්මක අඛණ්ඩතාව, සත්‍යය සෙවීම, සියලු ජීවීන් කෙරෙහි අනුකම්පාව සහ මිනිස් ආත්මයේ අඛණ්ඩ උන්නතිය තුළ මුල් බැසගත් දර්ශනයක්

ලෙස විඥානවාදය නොහොත් පරමාදර්ශවාදය පවතී. යථාර්ථය වඩාත් හොඳින් අවබෝධ කරගත හැක්කේ බාහිර නිරීක්ෂණයෙන් පමණක් නොව මිනිස් මනසෙහි අභ්‍යන්තර හැකියාවන් හරහා බව එය අවධාරණය කරයි. අභිප්‍රාය, අධ්‍යාත්මික තීක්ෂණ බුද්ධිය සහ කෙනෙකුගේ චරිතය හැඩගස්වන වටිනාකම් රැසක් එය අවධාරණය කරයි. මෙම අභ්‍යන්තර ගුණාංගවලට ප්‍රමුඛත්වය දීමෙන් විඥානවාදය මිනිස් ජීවිතය අවබෝධ කර ගැනීම සඳහා ගැඹුරු රාමුවක් ලබා දෙයි. ප්‍රඥාව, ගුණධර්ම සහ යහපත සඳහා නොසැලෙන කැපවීමකින් හැඩගැසුණු ලෝකය පිළිබඳ දැක්මක් කරා පුද්ගලයන්ට මඟ පෙන්වයි.

මෙම දාර්ශනික ධාරාව අධ්‍යාපනය ආයතනික ක්‍රියාවලියකට හෝ දැනුම ලබා ගැනීමේ මාධ්‍යයකට වඩා ඉගෙන ගන්නාගේ බුද්ධිමය, සදාචාරාත්මක, චිත්තවේගීය සහ අධ්‍යාත්මික මානයන් හැඩගස්වන පරිවර්තනීය ගමනක් පිළිබිඹු කරයි. පුද්ගලයෙකුගේ ආවේණික හැකියාවන් වර්ධනය කිරීම, විනයගරුක පුරුදු පෝෂණය කිරීම, සදාචාරාත්මක සංවේදීතාවන් වර්ධනය කිරීම සහ තමා, අන් අය සහ පුළුල් සමාජය කෙරෙහි ගැඹුරු වගකීමක් දිරිමත් කිරීම සඳහා අධ්‍යාපනය පදනම ලෙස සේවය කරයි. විවේචනාත්මක චින්තනය, පරාවර්තනය සහ ස්වයං දැනුවත්භාවය පෝෂණය කිරීම තුළින්, අධ්‍යාපනය නූතන ජීවිතයේ සංකීර්ණතා පැහැදිලිකම සහ අරමුණ සමඟ සැරිසැරීමට පුද්ගලයන්ට බලය ලබා දෙයි. මේ අර්ථයෙන් ගත්කල, පරමාදර්ශී අධ්‍යාපනය මානව සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ප්‍රවේශයක් ලෙස මතු වේ. එය අධ්‍යයන ජයග්‍රහණයන්ට හෝ වෘත්තීය කුසලතාවන්ට පමණක් සීමා නොව එය ඉගෙන ගන්නාගේ සමස්ත දැක්මක් ද වැළඳ ගනී. පරමාදර්ශී අධ්‍යාපනය මනස පිරිසිදු කිරීමට, උසස් අභිලාෂයන් වර්ධනය කිරීමට, ගුණවත් හැසිරීමට පෙළඹවීමට සහ විශ්වීය සත්‍යයන් සහ සදාචාරාත්මක මූලධර්ම ලුහුබැඳීමට දිරිගැන්වීමට උත්සාහ කරයි. එය අධ්‍යාපන ක්‍රියාවලිය තුළ මානවවාදී සහ දාර්ශනික ආත්මය පෝෂණය කරයි, යුක්තිය, අනුකම්පාව, ප්‍රඥාව සහ සදාචාරාත්මක වගකීම මත පදනම් වූ ලෝක දැක්මක් වර්ධනය කිරීමට ඉගෙන ගන්නන්ට හැකියාව ලබා දෙයි. ගැඹුරු ස්වයං අවබෝධයක් සහ සදාචාරාත්මක පරාවර්තනයක් කරා ඉගෙන ගන්නන්ට මඟ පෙන්වීමෙන්, පරමාදර්ශී අධ්‍යාපනය ඔවුන්ව පෞද්ගලික සාර්ථකත්වය සඳහා පමණක් නොව සමාජයේ

සදාචාරාත්මක හා සංස්කෘතික ජීවිතයේ අර්ථවත් සහභාගීත්වයක් සඳහා සූදානම් කරයි.

පරමාදර්ශී අධ්‍යාපනයේ වටිනාකම රඳා පවතින්නේ විද්‍යාත්මක දියුණුව, තාක්ෂණික නවෝත්පාදනය හෝ වෘත්තීය නිපුණතාවය සඳහා එහි දායකත්වය තුළ පමණක් නොවේ. මෙම මානයන් ප්‍රතික්ෂේප කළ නොහැකි තරම් වැදගත් වුව ද, විඥානවාදය මතක් කර දෙන්නේ අධ්‍යාපනයේ සැබෑ අරමුණ මිනිස් පුද්ගලයාගේ පූර්ණ සංවර්ධනය පෝෂණය කිරීම බව යි. පරමාදර්ශී අධ්‍යාපනය සාමකාමී සහ සදාචාරාත්මක ව සවිඥානික සමාජයක් හැඩගැස්වීමට උපකාරී වන වටිනාකම් පෝෂණය කරන අතර ම සංවේදනය දිරිමත් කරන අනුකම්පාව, විශ්වාසය පෝෂණය කරන සත්‍යවාදී බව, සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කරන වගකීම සහ තිරසාර සහජීවනයට ඉඩ සලසන සාමය අවධාරණය කරයි.

භෞතිකවාදය, තරඟකාරිත්වය සහ තාක්ෂණික ත්වරණය මගින් සලකුණු කරන ලද වේගයෙන් වෙනස් වන ලෝකයක, පරමාදර්ශී අධ්‍යාපනය මානව වර්ගයාගේ ගැඹුරුම අභිලාෂයන් තුළ මුල් බැසගත් ප්‍රති තුලනයක් ලබා දෙයි. එය සමාජයන් සමෘද්ධිමත් වන සදාචාරාත්මක පදනම් ශක්තිමත් කරන අතර ප්‍රගතිය හුදෙක් කාර්යක්ෂමතාව හෝ ආර්ථික ලාභයට වඩා සදාචාරාත්මක ප්‍රඥාව මගින් මෙහෙයවනු ලබන බව සහතික කරයි. මේ ආකාරයෙන්, දර්ශනය සහ අධ්‍යාපනය හවුල් මෙහෙවරක හවුල්කරුවන් ලෙස අභිසාරී වේඃ විවේචනාත්මක ව සිතන, සදාචාරාත්මක ව ක්‍රියා කරන සහ මනුෂ්‍යත්වයේ යහපැවැත්මට අර්ථවත් ලෙස දායක වන පුද්ගලයින් ජනනය කිරීම මෙහි මූලික අභිප්‍රාය බව පෙනේ.

විඥානවාදය සහ අධ්‍යාපනය එක් ව ගුණධර්මයෙන් පොහොසත්, තර්කානුකූල ව මෙහෙයවනු ලබන සහ සහකම්පනයෙන් යුතු තිරසාර සමාජයක් කරා යන මාවතක් ආලෝකවත් දිරිගන්වනු පෙනේ. අධ්‍යාපනයේ අවසාන ඉලක්කය වන්නේ දක්ෂ සේවකයින් බිහි කිරීම පමණක් නොව, වඩාත් සාධාරණ, සාමකාමී සහ ප්‍රබුද්ධ ලෝකයක් නිර්මාණය කළ හැකි කල්පනාකාරී, වගකිවයුතු සහ සදාචාරාත්මක ව පදනම් වූ මිනිසුන් හැඩගැස්වීම බව විඥානවාදී

අධ්‍යාපන චින්තනය සහතික කරන්නේ ඊට සර්ව කාලීන අගයක් ද එක් කරමිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*මජ්ඣිමනිකාය*, (1 1973, 2 1973, 3 1974). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය*, (1964). අනුවාදක: ඥානසීහ හිමි, හේන්පිටගෙදර., කොළඹ: සී/ස ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

*සංයුත්තනිකාය*, (1 1960, 2 1962, 3 1983, 4 1981, 5 I 1982, 5 II 1983). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

අබේපාල, ඒ., (2019). *අධ්‍යාපන දර්ශනයේ පෙරදිග චින්තන පැතිකඩ*. කොට්ටාව: සාර ප්‍රකාශන.

කුමාරපේලි, ටී., (2022). *අධ්‍යාපනික දාර්ශනික පදනම*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චන්ද්‍රසේකර, එච්. එම්., (2009). *අධ්‍යාපනයෙහි දාර්ශනික පසුබිම*. කොට්ටාව: සාර ප්‍රකාශන.

ඥානසිරි, පී. ජී. එස්., (1995). *සම්භාව්‍ය දාර්ශනික ගුරුකුල*. පොල්ගහවෙල: කේ.වී. නන්දසේන.

රාජපක්ෂ, ආර්. එස්., (2009). *දර්ශනවාදයේ ගැටලු. (රසල් බ්‍ර්ට්‍රන්ඩ්)*. පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

විදානගමගේ, කේ., (1997). *දාර්ශනික ගැටලු*. කර්තෘ ප්‍රකාශනයකි.

සේනාධීර, එස්., (2006). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.